# තනතුරු ඇබෑර්තු

## ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

## කථන චිකිත්සක ( iii ශ්‍රේණිය )

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ පවතින **කථන චිකිත්සක තනතුරු 01 ක්** සඳහා සුදුසු නිලධාරීන් බඳවා ගැනීමට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ , සමාජ සේවා දෙපාර්තමේන්තුව , 02 වන මහල , II අදියර , සෙත්සිරිපාය ,බත්තරමුල්ල ලිපිනයට 2026.08.28 දිනට පෙර ලැබෙන සේ තැපෑලෙන් හෝ ගෙනවිත් භාර දිය යුතුය.අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ " **කථන චිකිත්සක තනතුරට බඳවා ගැනීම**"යනුවෙන් සඳහන් කර තිබිය යුතුය. www.socialservices.gov.lk වෙබ් අඩවිය හරහා ද ආදර්ශ අයදුම්පත හා විස්තර ලබා ගත හැක.

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට බලාපොරොත්තු වන නිලධාරීන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**1. විවෘත බඳවා ගැනීම**

**1.1 වයස් සීමාව ;-**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවු 21 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුයි.

1.2 **අධ්‍යාපන සුදුසුකම් ;-**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් කථන චිකිත්සාව පිළිබඳව උපාධියක් හෝ කථන චිකිත්සාව පිළිබඳ වසර 02කට නොඅඩු පූර්ණ කාලීන ඩිප්ලෝමාවක් ලබා තිබීම.

1.3 **කායික සුදුසුකම් :-**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රීලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් , තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1.4 **වෙනත් : -**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ය චරිතයකින් යුක්ත විය යුතුය .
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය .

**1.5 බඳවා ගැනීමේ ක්‍රමය :-**

ලිඛිත පරීක්ෂණය සමත් වූ සුදුසුකම් ලත් තැනැත්තන් අතුරින් ලිඛිත පරීක්ෂණයේදී ලබාගත් ප්‍රතිඵල වල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගනු ලැබේ.

**1.6 ලිඛිත පරීක්ෂණය :-**

| විෂයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | කාලය පැය 01 | 100% | 40% |
| සාමාන්‍ය දැනීම | කාලය පැය 01 | 100% | 40% |

**1.7 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-**

තනතුරට නියමිත සුදුසුකම් සපුරා තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා සහතිකපත් පරීක්ෂාව (ලකුණු ලබා දෙනු නොලැබේ )

**1.8 වැටුප් පරිමාණය :-**

1.8.1 වැටුප් කේත අංකය : MN -6 – 2025

1.8.2 වැටුප් පරිමාණය : රු.54,120-10x800-11x1190-10x1320-10x1350-101,910/-
( මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ )

**1.9 සේවා කොන්දේසි :-**

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. තවද,ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය . රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

2.0 සටහන :-

ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතු වේ.

දර්ශනී කරුණාරත්න
සමාජ සේවා අධ්‍යක්ෂ

සමාජ සේවා දෙපාර්තමේන්තුව
2 වන මහල
11 වන අදියර
සෙත්සිරිපාය
බත්තරමුල්ල